// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2298/23 - 2022 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා - 2022.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී 9/73 (XII) (A)

**(469 වැනි අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වැනි වගන්තිය යටතේ වූ නියමය

(469 වැනි අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය මහින්ද අමරවීර වන මා විසින් "ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය" ලෙස, එහි උපලේඛනයේ විස්තර කර ඇත්තා වූ ජාතික රක්ෂිතය ප්‍රකාශයට පත් කර ඇති, 2009 ජූලි මස 13 වැනි දින අංක 1610/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (3) වන අයිතමයෙහි "ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය" යන වචන වෙනුවට "යාල ජාතික උද්‍යානය - VI" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි උපලේඛනයෙහි, "ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයට අයත් භූමි ප්‍රදේශයේ සීමා" යන වචන වෙනුවට "යාල ජාතික උද්‍යානය - VI කොටසට අයත් භූමි ප්‍රදේශයේ සීමා" යන වචන ආදේශ කිරීමෙන්.

මහින්ද අමරවීර,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2022 අගෝස්තු මස 30 වන දින,
කොළඹ දීය.

EOG 09 - 0228

1A - PG 5999 — 606 (2022/09)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*